**IPRC/16/178**

# ලංකාවේ වර්ෂ නිරූපණය සඳහා යොදාගත් කටපයාදී ක්‍රමය

හසිත චාමිකර ගුණසිංහ[1*]

සන්නිවේදනයේ ඉදිරි පියවරක් ලෙස අතීත මිනිසා ලේඛන කලාවට පිවිසීමත් සමග සංඛ්‍යාත්මක අගයයන් ද ලිඛිත මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමට උත්සුක වූ බව පෙනේ. ආරම්භයේ දී අක්ෂර භාවිතයෙන්ම සංඛ්‍යාත්මක අගයයන් නිරූපණය කරනු ලැබුව ද, පසුව ඒ සඳහාම වෙන් වූ විශේෂිත සංකේත භාවිත කරන ලදී. එක් එක් ශිෂ්ටාචාරවලට අනන්‍ය වූ ලක්ෂණ සහිත අංකන ක්‍රම බිහිවන්නේ ඒ අනුව ය. ලාංකේය ශිෂ්ටාචාරය තුළ ද එක් එක් කාලවකවානුවේදී අංකනය සඳහා භාවිත කරන ලද බවට හඳුනාගත හැකි දේශීය මෙන්ම විදේශීය අංකන ක්‍රම කිහිපයකි.

ලාංකිකයන් විසින් වර්ෂ නිරූපණය කිරීමේ කාර්යය සඳහා භාවිත කරන ලද අංකන ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කොටගත් මෙම අධ්‍යයනයේ ගැටළුව බවට පත්වූයේ කටපයාදී ක්‍රමය කිනම් අන්දමින් රජරට රාජධානි සමයේ පටන් මේ දක්වා ලංකාව තුළ භාවිත වන්නේ ද යන්න සොයාබැලීමයි. සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය මෙහි දී යොදාගනු ලැබුවේ අධ්‍යයන ක්‍රමවේදය වශයෙනි.

ව්‍යංජන අක්ෂරවලට සංඛ්‍යාත්මක අගයයන් ආදේශ කොට අංකනය සඳහා යොදාගැනෙන කටපයාදී ක්‍රමය, ක්‍රි.ව. පස්වන සියවසේ පමණ ඉන්දියාවේ දී නිර්මාණයට වන්නට ඇතැයි පිළිගැනේ. එහෙත් මෙම ක්‍රමය පිළිබඳ ලංකාවෙන් හමුවන පැරණිතම සාධකය දැකගත හැකි වන්නේ පොළොන්නරු යුගයට සමකාලීනව ය. මහනුවර යුගය වන විට වැඩි අවධානයක් හිමිව තිබූ කටපයාදී ක්‍රමය, පහතරට මුහුදුබඩ පළාත් ආශ්‍රිතව වැඩි වශයෙන් භාවිත වී ඇති අන්දම දැකගත හැකිය.

කටපයාදී ක්‍රමයේ ඇති විශේෂත්වය වන්නේ එක් සංඛ්‍යාවක් නිරූපණය සඳහා අක්ෂර කිහිපයක් භාවිත වීමයි. එමගින් අංකනය සඟවමින් කේතනය කිරීමක් සිදුවන හෙයින් මෙකී ක්‍රමය පිළිබඳ දැනුවත් අයට පමණක් සංඛ්‍යා හඳුනාගැනීමේ අවකාශය හිමි වේ. මේ හැරුණු විට දීර්ඝ අංකන පහසුවෙන් මතක තබාගැනීමට කටපයාදී ක්‍රමය යොදාගත් අන්දම ජ්‍යොතිෂය, තාරකා ශාස්ත්‍රය හා ගණිතය වැනි විෂයයන් යටතේ සම්පාදනය වූ භාරතීය පාඨ ග්‍රන්ථවලින් දැකගත හැකිය. එපමණක් නොව දක්ෂිණ භාරතීය සංගීත ප්‍රස්ථාරකරණය සඳහා ද භාරතීයයන් විසින් මෙම ක්‍රමය යොදාගනු ලබන බව කියැවේ.

අංකනය පිළිබඳ පැරණි ලාංකිකයන් සතු වූ පුළුල් ආකල්පය පිළිබිඹු කෙරෙන කටපයාදී ක්‍රමයට අතිරේකව මෙරට භාවිත කරන ලද සිංහල ඉලක්කම්, ලිත් ඉලක්කම් හා භූත සංඛ්‍යා ආදී අංකන ක්‍රම සියල්ලම පාහේ වර්තමානය වන විට අභාවිතයට පත්ව ඇති අතර හින්දු අරාබි ඉලක්කම් ක්‍රමය පමණක් පොදුවේ භාවිත කෙරෙන බව පෙනෙන්නට තිබේ.

***ප්‍රමුඛ පද :*** *පැරණි අංකන ක්‍රම, කටපයාදී ක්‍රමය, බ්‍රාහ්මී ඉලක්කම්, සිංහල ඉලක්කම්, ලිත් ඉලක්කම්, භූත සංඛ්‍යා*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *hachagu@gmail.com